සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

19657

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

14 | S | I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

| | | |
|---|---|---|
| කතෝලික ධර්මය | I, II | පැය තුනයි |
| கத்தோலிக்கத் திருமறை | I, II | மூன்று மணித்தியாலம் |
| Catholicism | I, II | Three hours |

## කතෝලික ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **වඩාත් නිවැරදි** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. "දෙවියන් වහන්සේ ලෝකය මවා එය මනහර බව දුටු සේක" යනුවෙන් අදහස් කරනුයේ,
 (1) දෙවිඳුන්ගේ ආශිර්වාදය හා කැමැත්ත අනුව ලෝකය නිර්මාණය වූ බව ය.
 (2) දෙවියන් වහන්සේ මැවූ ලෝකය ඉතා වටිනා සම්පතක් බව ය.
 (3) ලෝකය සම්පත්වලින් පුරවා එය ආශිර්වාද කළ බව ය.
 (4) දෙවියන් වහන්සේ තම කැමැත්ත පරිදි සියලු මැවිලි ඇති වීමට සැලසූ බව ය.

2. උත්පත්ති පොතේ සඳහන් වන දේදුන්නේ සළකුණට පසුබිම වූයේ දෙවියන් වහන්සේ ................. සමග ඇති කරගත් ගිවිසුම ය. හිස්තැනට යෝග්‍යය වචනය වනුයේ
 (1) ආබ්‍රහම් (2) නෝවා (3) මෝසෙස් (4) ජාකොබ්

3. ජේසුස් වහන්සේගේ උපත අපට සුභාරංචියක් වනුයේ උන්වහන්සේ,
 (1) දෙවියන් වහන්සේ වෙතින් පැමිණි තැනැත්තෙක් වූ නිසා ය.
 (2) පැරණි ගිවිසුමේ දිවැස් වැකි සම්පූර්ණ කළ නිසා ය.
 (3) ලෝකයට ගැලවීම ගෙන දුන් නිසා ය.
 (4) දවිත්ගේ පෙළපතින් පැවතෙන්නෙක් නිසා ය.

4. ජේසුස් වහන්සේ අන්‍ය රූප විලාශවීමේ දී මෝසෙස් හා එළියා සමඟ ඇති වූ සාකච්ඡාවේ ප්‍රධාන මාතෘකාව වූයේ,
 (1) දස පණත නිසි ලෙස පිළිපැදීම ය.
 (2) පැරණි දිවැසිවරුන්ගේ දිවැස්වැකි පූර්ණත්වයට පත්වීම ය.
 (3) ජේසුස් වහන්සේගේ දෙවන ආගමනය ගැන ය.
 (4) ජේසුස් වහන්සේ ජෙරුසලමේ සිදු කිරීමට නියමිත ජීවිත පූජාව ගැන ය.

5. "වචනය තෙම ද මාංශගත වී අප සමඟ වාසය කළ සේක." කිතුනු ඒකක සාකච්ඡාවේ දී වැඩිහිටියෙක් ඉහත සඳහන් බයිබල් පාඨය විස්තර කළ අයුරු පහත දක්වෙන අතර එයින් වඩාත් නිවැරදි වනුයේ,
 (1) ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේ මනුෂ්‍යත්වය ලැබීම යන්න ය.
 (2) දේව වචනය මිනිස් හදවත්වලට ඇතුළුවීම යන්න ය.
 (3) දේව වචනය නිතර කියවීමට පෙලඹීම යන්න ය.
 (4) දේව වචනය තුළ සත්‍යයට සාක්ෂි දරීම යන්න ය.

6. "මනුෂ්‍ය පුත්‍රයාණන් වැඩියේ සේවය ලැබීමට නොව සේවය කරන්නටත් බොහෝ දෙනෙකුගේ මිදීම උදෙසා .................ය." හිස්තැනට යෙදෙනුයේ
 (1) ශුභාරංචිය දෙසීමටත් (2) සිය දිවි පිදීමටත්
 (3) දේව රාජ්‍යය පැතිරවීමටත් (4) දේව ආදරය පෙන්වීමටත්

[ දෙවැනි පිටුව බලන්න.

7. මැවිල්ල තුළින් දෙවියන් වහන්සේගේ මහිමය දකින අපි .............. තුළින් දෙවියන් වහන්සේව හමු වන්නේ ය. හිස්තැනට යෝග්‍ය වචනය වනුයේ
(1) ප්‍රාතිහාර්ය (2) සලකුණු (3) යාච්ඤාව (4) ව්‍යවස්ථාව

8. පාසල්වියේ පසුවන ඔබ විද්‍යාව දෙස බැලිය යුත්තේ කෙසේ ද?
(1) විශ්ව ගම්මානයට පිවිසෙන දොරටුවක් ලෙස ය.
(2) මිනිස් ජීවිත සුඛිත මුදිත කරන්නක් ලෙස ය.
(3) මිනිස් ප්‍රයත්නයේ සාර්ථකත්වයක් ලෙස ය.
(4) මිනිසාට ලැබී ඇති ප්‍රඥාවේ ප්‍රසාරණය වීමක් ලෙස ය.

9. කිතුනුවා තම පව් පූජාප්‍රසාදිතුමා ඉදිරියේ ප්‍රකාශ කරනුයේ
(1) තමා දෙවියන් වහන්සේටත්, සමාජයටත් විරුද්ධව පව් කරන නිසා ය.
(2) ප්‍රසිද්ධියේ පව් කීම ලැජ්ජා සහගත නිසා ය.
(3) තම පව් තවත් කෙනෙකුට කීමට ඇති බිය නිසා ය.
(4) තමන්ගේ ජීවිතයේ පෞද්ගලික භාවය රැකීම සඳහා ය.

10. යාච්ඤාව හා පශ්චත්තාපික ක්‍රියා මගින් ලෝකයේ පාපී බලවේග පරාජය කිරීමට ඇති කරනු ලැබූ "මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව" නැමැති සංවිධානයේ නිර්මාතෘ වනුයේ
(1) XII වන පියුස් පාප්තුමා ය. (2) මැක්ෂිමිලියන් කෝල්බේ පියතුමා ය.
(3) II ජුවාම් පාවුළු පාප්තුමා ය. (4) තෙරේසා මව්තුමිය ය.

11. නිල පූජක ධූර මට්ටම් තුන වනුයේ
(1) රාජකීය, පූජක සහ දිවැයි ය. (2) ගිහි, පැවිදි සහ පූජක ය.
(3) රදගුරු, පූජක සහ තේවාචාරී ය. (4) රදගුරු, කාර්දිනල් සහ ශුද්ධෝත්තම පියතුමා ය.

12. මෙරට ලන්දේසි බල ප්‍රදේශ තුළ අධ්‍යාපනය පිළිබඳ ගන්නා ලද ප්‍රධාන තීන්දුව වූයේ
(1) ලන්දේසි භාෂාව අනිවාර්ය විෂයයක් කිරීම ය. (2) දහම් පාසල් නගා සිටුවීම ය.
(3) ගුරු විද්‍යාල පිහිටුවීම ය. (4) කතෝලික ධර්මය ඉගැන්වීම තහනම් කිරීම ය.

13. පැවිදි වේදභාර වනුයේ
(1) දිළිඳුකම, ව්‍රත ශුද්ධිය හා කීකරුකම ය. (2) දිළිඳුකම, කීකරුකම හා බැහැපත්කම ය.
(3) බඹසර රැකීම, කීකරුකම හා නිර්හීතකම ය. (4) නිර්හීතකම, කීකරුකම හා බැහැපත්කම ය.

14. එම්මාවුස් ගමට ගිය ගෝලයින් දෙදෙනා එදිනම පෙරළා ජෙරුසෙලමට පිටත් වූයේ
(1) ජේසුස් වහන්සේගේ ශරීරය සොහොනෙහි නොතිබුණු බව දැන ගන්නට ලැබුණු නිසා ය.
(2) ජේසුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වී ඇතැයි යන පණිවුඩය ඔවුන්ට ලැබුණු නිසා ය.
(3) අනෙක් ගෝලයින් ඔවුන්ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටි නිසා ය.
(4) උත්ථාන වූ ජේසුස් වහන්සේ ඔවුන් දුටු බව අනෙකුත් ගෝලයින්ට දැන්වීම සඳහා ය.

15. උපත් ද සිට අන්ධව සිටි තැනැත්තෙකු සුව කිරීමේ ප්‍රාතිහාර්යය මගින් පෙනී යන්නේ
(1) ජනතාව වෙත ඇති දෙවියන් වහන්සේගේ අසීමිත සානුකම්පිත ආදරය ය.
(2) මැවිල්ල නවතාවයකට පත් කිරීමට මැවුම්කරුට හැකි බව ය.
(3) දේව පුත්‍රයා ජුදා ජනතාව අතර තම කීර්තිය පතුරවා හැරිය බව ය.
(4) මිනිසා තුළ විශ්වාසය වැඩි කිරීමට දෙවියන් වහන්සේට හැකි බව ය.

16. සභාවේ ආරම්භක දිනය ලෙස සැලකෙනුයේ
(1) අහස් නැඟී මංගල්‍යය ද ය. (2) පෙන්තකොස්ත මංගල්‍යය ද ය.
(3) පාස්කු මංගල්‍යය ද ය. (4) ජයග්‍රාහී ලෙස ජෙරුසෙලමට ඇතුළු වූ ද ය.

17. ජාකොබ් නිසා ඒසව්ට සිදු වූ අසාධාරණය වන්නේ
(1) තම පෙළපතේ නායකත්වය අහිමිවීම ය. (2) තම සොයුරා අහිමිවීම ය.
(3) තම පියාගේ ආශිර්වාදය අහිමිවීම ය. (4) තමා ජීවත් වූ ප්‍රදේශයෙන් පලා යාමට සිදුවීම ය.

18. "නුසුදුසු ලෙස ස්වාමීන් වහන්සේගේ මේ රොටි වළඳන, මේ කුසලානෙන් පානය කරන කවරෙක් වුවද එසේ වැළඳීමෙන් හා පානය කිරීමෙන් ස්වාමීන් වහන්සේගේ ශරීරයට හා රුධිරයට විරුද්ධව පව් කිරීමේ වරදකරුවෙක් වන්නේ ය." යන ඉගැන්වීම සඳහන්වන ශුද්ධ වූ පාවුළු තුමාගේ ලිපිය වනුයේ
(1) ගලාති ලිපිය ය. (2) රෝම ලිපිය ය.
(3) II කොරෙන්ති ලිපිය ය. (4) I කොරෙන්ති ලිපිය ය.

[ තුන්වැනි පිටුව බලන්න.

19. "යමෙකු වතුරෙන් ද, ශුද්ධාත්මයාණන්ගෙන් ද නැවත නූපන්නොත් දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැක ගත නොහැකි ය" යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ
(1) නිකදේමුස්ට ය. (2) පේදුරුට ය. (3) සකේවුස්ට ය. (4) තෝමස්ට ය.

20. අජිත් තම පියාට රෝගීන්ගේ ආලේපය දනය කිරීම සඳහා මීසමේ පියතුමා කැඳවා ගෙන පැමිණියේ
(1) ශුද්ධ වූ තෙලයෙන් තම පියා ආලේප කර ගැනීම සඳහා ය.
(2) තම පියාට ආධ්‍යාත්මික හා මානසික සුවය ලබා දීමට ය.
(3) තම පවුලේ සාමාජිකයන් සනසාලීමට ය.
(4) නැවත නැවත මෙම සක්‍රමේන්තුව ලබා ගැනීමට හැකි නිසා ය.

21. ජේසුස් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය හඳුන්වනුයේ
(1) මාංශගතවීම ලෙසිනි. (2) දේව අනාවරණය ලෙසිනි.
(3) පාස්කු අභිරහස ලෙසිනි. (4) තම දූත කාර්යේ සමාප්තිය ලෙසිනි.

22. කායින් විසින් ආබෙල් මැරීම තුළින් හෙළිදරව් වනුයේ
(1) කායින් මිනීමරුවෙක් බව ය.
(2) කායින් මානසික පීඩාකාරී තත්ත්වයකට පත්වූ බව ය.
(3) කායින් සහෝදරයාට දක් වූ ඊර්ෂ්‍යාව ය.
(4) කායින්, දෙවියන් හා ඔහුගේ සහෝදරයා සමඟ පැවති සම්බන්ධතාවය කඩා වැටීම ය.

23. "මාගේ අසල්වැසියා කවුද?" යන පැනයට පිළිතුරු වශයෙන් ජේසුස් වහන්සේ විසින් වදළේ
(1) යහපත් සමරිතානුවරයාගේ උපමාව ය. (2) නාස්තිකාර පුත්‍රයාගේ උපමාව ය.
(3) වපුරන්නාගේ උපමාව ය. (4) ධනවතා හා ලාසරස්ගේ උපමාව ය.

24. 'දූන ගැන්මේ' දීමනාව විශ්වාසකයනට ලැබෙනුයේ .............. නැමති සක්‍රමේන්තුව මගිනි. හිස්තැනට යෝග්‍ය වනුයේ
(1) ප්‍රසාද ස්නාපනය (2) අභිවෘද්ධි ආලේපය ,
(3) දිව්‍ය සත්ප්‍රසාදය (4) පූජාත්වරය

25. ශ්‍රාවකයින්ගේ පාද සේදීම තුළින් ජේසුස් වහන්සේ අපට තහවුරු කරනුයේ
(1) වගකීම් ඉටු කළ යුතු බව ය. (2) මුල් තැන ගෙන කටයුතු කළ යුතු බව ය.
(3) නායකයා සේවකයා විය යුතු බව ය. (4) අන්‍යයන්ගේ සේවය ලබා ගත යුතු බව ය.

26. දිව්‍ය පූජාවට සහභාගි වීම තුළින්
(1) මීසම් පවුලේ සාමූහික යාගයට එක් වේ. (2) ජේසු සමිඳුන්ගේ කුරුසියේ යාගයට එක් වේ.
(3) දේව ප්‍රශංසාවට මඟ පැදේ. (4) දේව වචනයට සවන් දීමට අවකාශ ලැබේ.

27. සදාචාර සම්පන්න සමාජයක් බිහි කිරීමට පාලකයින් සතු වගකීම් ගැන නායකත්ව කඳවුරක දී මෙලෙස සාකච්ඡා විය.
A - තමන්ගෙන් සේවය ලබන පුරවැසියන්ට සාධාරණය ඉටු කිරීම හා කාරුණික වීම
B - පාලක පන්තිය සුඛෝපභෝගී පැවැත්මක් සඳහා සේවක පන්තිය යොදා ගැනීම
C - තම නායකත්වය තුළ පැවරෙන වගකීම් අවංකව නිසි අයුරින් ඉටු කිරීම
D - පොදු සංවර්ධන කටයුතුවල දී ඇල්මැරුණු ස්වභාවයකින් කටයුතු කිරීම
ඉහත සඳහන් ප්‍රකාශ වලින් වඩාත් නිවැරදි වනුයේ
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) A, B, C සහ D ය.

28. මේරි තම විදුහලේ විදුහල්පති තුමාට, ගුරුවරුන්ට, ශිෂ්‍ය නායකයින්ට සහ සමාජයේ වැඩිහිටියන්ට ගරු කිරීම හා කීකරුවීම ඇගේ පන්තියේ ම සිටි අයුන්තා දුටුවේ,
(1) හොඳ නමක් ලබා ගැනීමට දරන ප්‍රයත්නයක් ලෙසිනි.
(2) මේරි විසින් වගකීම් හා යුතුකම් ඉටුකරන ආකාරය ය.
(3) කාගේත් හිත දිනා ගැනීමට මේරිට ඇති හැකියාව ය.
(4) යම් යම් වාසි තකා මේරි කටයුතු කරන අයුරු ය.

29. කිතුනුවා ලබා ඇති ප්‍රසාද ස්නාපනීය කැඳවීම ඉටු කළ යුතු මූලික වගකීම වනුයේ,
(1) සෑම ඉරු දිනක ම දිව්‍ය පූජාවට යාම ය. (2) දුක් කරදර සතුටු සිතින් දරා ගැනීම ය.
(3) තම විශ්වාසයට සාක්ෂි දැරීම ය. (4) සභා නායකයින්ට නිරතුරුව ම කීකරුවීම ය.

19657

30. දහම් ගුරුතුමිය ඉරුදින දහම් පාසැලේ දී සදචාරාත්මක කිතුනුවෙක් ලෙස ජීවත්වීම සඳහා "අනුන්ගේ දේ සොරකම් නොකළ යුතු බව" ඉගැන්වූවා ය. මෙම ඉගැන්වීමට අනුව පිළිපැදිය යුතු පණත් දෙක වන්නේ,
(1) 4 සහ 8 ය. (2) 5 සහ 10 ය. (3) 7 සහ 8 ය. (4) 7 සහ 10 ය.

31. "යාච්ඤා කිරීමට නොදන්නා පුද්ගලයා ජීවත්වීමට නොදනී." මෙසේ පවසන ලද්දේ
(1) ශුද්ධ වූ ජෝන් ක්‍රිසොස්තම් තුමා ය. (2) ශුද්ධ වූ ෆ්‍රැන්සිස් අසීසි තුමා ය.
(3) ශුද්ධ වූ අගොස්තීනු තුමා ය. (4) ශුද්ධ වූ බෙනදික් තුමා ය.

32. ගෙත්සමනී උයනේ දී ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයින්ට අවවාද කළේ,
(1) උන්වහන්සේ ආරක්ෂා කිරීමට සූදානම් වෙන්නැයි කියා ය.
(2) පරීක්ෂාවට නොවැටෙන ලෙස යාච්ඤා කරන්න යැයි කියා ය.
(3) සතුරන් පැමිණුනොත් පලා යන්න යැයි කියා ය.
(4) දේව දූත සේනාවක් පැමිණෙන තුරු බලා සිටින්න යැයි කියා ය.

33. ජේසුස් වහන්සේ නිතර නිතර දෙවි පියාට යාච්ඤා කළේ,
(1) ජුද නීතිය පිළිපැදීම සඳහා ය. (2) යක්ෂ පරීක්ෂාවලට හසු නොවීමට ය.
(3) දේව කැමැත්ත දැන ගැනීම සඳහා ය. (4) යාච්ඤාව පිළිබඳව ගෝලයින් දැනුවත් කිරීමට ය.

34. නොකඩවා යාච්ඤා කිරීමේ අගය පෙන්වා දෙන උපමාව වන්නේ
(1) පරිසිවරයා හා අයකැමියා ය. (2) යුවතියන් දසදෙනා ය.
(3) යහපත් සමරිතානුවරයා ය. (4) වැන්දඹුව හා විනිශ්චයකාරයා ය.

35. උත්තම පූජක යාච්ඤාව ක්‍රිස්තුස් වහන්සේ
(1) ගෝලයින්ට ඉගැන්වූ යැදුමකි.
(2) ගෝලයින් සමඟ කළ යැදුමකි.
(3) ශ්‍රාවකයින් තෝරා ගැනීමට පෙර කළ යැදුමකි.
(4) තමන් විසින් ම දෙවි පියාට කරන ලද යැදුමකි.

36. ඔබ පවුලේ සැම දෙනා එක් රැස් වී දිනපතා යාච්ඤා කිරීම කුමන යාච්ඤා වර්ගයට අයත් වේ ද?
(1) සාමූහික (2) පෞද්ගලික (3) පොදු (4) භාවනා

37. "රෝගීන්ට මිස නිරෝගීන්ට වෛද්‍යගෙන් වැඩක් නැත." ජේසුස් වහන්සේ මෙයින් අදහස් කරනුයේ
(1) දෙවියන් වහන්සේගේ අසීමිත ආදරය ය.
(2) දෙවියන් වහන්සේ පව්කාරයාට දක්වන අපිරිමිත දයාව ය.
(3) රෝගීන්ට සුවය දනය කිරීම දෙවියන් වහන්සේ සතු බව ය.
(4) රෝගීහු සුවය පතා යාච්ඤා කළ යුතු බව ය.

38. කිතුනුවන් යාච්ඤා කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ
(1) දෙවියන්ගෙන් කැමති ඕනෑම දෙයක් ඉල්ලා ගැනීම ය.
(2) ශුද්ධවන්තයින් ලෙස පෙනී සිටීම ය.
(3) දෙවියන් වහන්සේ සමඟ ඇති සම්බන්ධතාව තහවුරු කර ගැනීම ය.
(4) අපගේ පව් වලට පසුතැවිලි වීම ය.

39. ප්‍රශංසාව හා ඉල්ලීම අන්තර්ගත වී ඇති යාච්ඤාව නම්
(1) උත්තම පූජක යාච්ඤාව ය. (2) යාම යැදුම ය.
(3) තුන්කාල ආරාධනාව ය. (4) ස්වාමිවාක් ආරාධනාව ය.

40. "දේව සමානකම" කුමක් ද යන්න එක්තරා වැඩිහිටියෙක් පහත සඳහන් අයුරින් ප්‍රකාශ කළේ ය. ඒ අතරින් වඩාත් සුදුසු වනුයේ
(1) දෙවියන් වහන්සේගේ හැඩයට ඔබින අයුරින් මැවීම ය.
(2) දෙවියන් වහන්සේ මෙන් සියල්ලේ අධිපති වීම ය.
(3) මිනිසා ප්‍රඥවන්තව, නිදහස් කැමැත්තක් ඇතිව අමරණීයතාවකට පත්වීම ය.
(4) සියල්ලෙන් ම සෑහීමකට පත් වී ජීවත් වීම ය.

**

[ පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**14 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

කතෝලික ධර්මය I, II
கத்தோலிக்கத் திருமறை I, II
Catholicism I, II

## කතෝලික ධර්මය II

※ පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. (i) දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දෙන ලද පොරොන්දු **දෙකක්** ලියන්න.

   (ii) ඉශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශයට යන ගමනේ දී දෙවියන් වහන්සේ ඔවුන් පෝෂණය කළ ආහාරයත්, නව ගිවිසුමේ ක්‍රිස්තුස් වහන්සේ ස්ථාපිත කළ භෝජනයත් **වෙන් වෙන්ව** නම් කරන්න.

   (iii) දෙවියන් වහන්සේ තම පුත්‍රයාණන්ගේ 'පුත්‍ර භාවය' හෙළි කළ අවස්ථා **දෙකක්** ලියන්න.

   (iv) ජේසුස් වහන්සේ රෝගීන් සුව කළ ආකාර **දෙකක්** ලියන්න.

   (v) පෙන්තකොස්ත මංගල්‍යය දින ශ්‍රාවකයන් වෙත ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කිරීම සංකේතවත් කරන සලකුණු **දෙකක්** නම් කරන්න.

   (vi) ලූක් සුවිශේෂයේ සඳහන් ප්‍රශංසා ගීත (උදන ගී) **දෙකක්** ලියන්න.

   (vii) ශුද්ධ වූ සභාවේ යාච්ඤා වර්ග (ප්‍රභේද) **දෙකක්** නම් කරන්න.

   (viii) ශුද්ධ වූ සභාව ජන වන්දනාව තුළ අද්විතීය ලෙස සමරන මෙහෙය කුමක් ද?

   (ix) කතෝලික විවාහයට ඇති බාධා **දෙකක්** නම් කරන්න.

   (x) මෙරට පෘතුගීසි යුගයේ දී ධර්ම දූත සේවාව සඳහා පැමිණි පළමු ධර්ම දූත කණ්ඩායම් **දෙකක්** නම් කරන්න.
   *(ලකුණු 2 × 10 = 20 යි)*

2. (i) මෙරට ලන්දේසි පාලන සමය තුළ කතෝලික විශ්වාසය රැක ගැනීමට පුරෝගාමී වූ ඔරතෝරියානු පියවරු **දෙදෙනෙකු** නම් කරන්න.

   (ii) පෘතුගීසි ධර්ම දූත සේවය මෙරට සාර්ථක වීමට බලපෑ හේතු **තුනක්** දක්වන්න.

   (iii) කතෝලික විශ්වාසය රැක ගැනීම සඳහා ඔබේ මීසම තුළ ඔබට ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම් **පහක්** වචන 75 කින් පමණ විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

3. (i) ජේසුස් වහන්සේ පෞද්ගලිකව යාච්ඤා කළ අවස්ථා **දෙකක්** ලියන්න.

   (ii) "නිර්මල සිත් ඇත්තෝ භාග්‍ය වන්තයෝ ය. ඔවුහු දෙවියන් වහන්සේ දකින්නෝ ය." කරුණු **තුනක්** ඉදිරිපත් කරමින් මෙම අදහස පැහැදිලි කරන්න.

   (iii) ජේසුස් වහන්සේ වදාළ භාග්‍ය අට මඟින් ඔබේ ජීවිතයට උචිත ප්‍රතිපත්ති **පහක්** කෙටියෙන් විස්තර කරන්න.
   *(ලකුණු 10 යි)*

4. (i) දස පණතේ අන්තර්ගත වී ඇති මූලික ඉගැන්වීම් **දෙක** ලියන්න.

   (ii) කතෝලික ධර්මෝපදේශයට අනුව අටවන පණතින් අපට නියෝග කරන ඉගැන්වීම් **තුනක්** ලියන්න.

   (iii) දස පණත පිළිපදින කිතුනුවකු වන ඔබ පිළිපැදිය යුතු ධර්ම ගුණ **පහක්** ලියන්න. *(ලකුණු 10 යි)*

[ හයවැනි පිටුව බලන්න.

5. (i) ශුද්ධ වූ සභාව තුළ සියලු ක්‍රිස්තියානි විශ්වාසකයින් බෙද වෙන් කරන ප්‍රධාන කොටස් දෙක කුමක් ද?
(ii) ආත්මික නායකයින් වෙත ගිහියා විසින් ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න.
(iii) කතෝලික සභාවේ ගිහි දූත සේවාවන්ගෙන් (සමිති සමාගම් වලින්) ඉටුවන කාර්යයන් පහක් පැහැදිලි කරන්න.
(ලකුණු 10 යි)

6. (i) ක්‍රිස්තුස් වහන්සේ ශ්‍රාවකයින් දෙළොස් දෙනා තෝරා පත් කිරීමේ දී ඔවුන්ට දුන් බලතල දෙකක් සඳහන් කරන්න.
(ii) ලූක් සුවිශේෂයේ 9:3-6 හි සඳහන් පරිදි ශ්‍රාවකයින් දෙළොස් දෙනා පිටත් කර යැවීමේ දී ක්‍රිස්තුස් වහන්සේ ඔවුන්ට දුන් උපදෙස් තුනක් ලියන්න.
(iii) දිව්‍ය පූජා යාගයට සහභාගි වීම තුළින් සාමයේ දූතයෙකු ලෙස ක්‍රිස්තු ඉගැන්වීම් සමාජයට බෙද දෙන අයුරු කරුණු පහක් ගෙන හැර පාමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

7. පහත සඳහන් මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
(i) "මැරෙන්නට සිදු වුවත් මාගේ දේව ජීවිතය නැති කර ගන්නේ නැත." මරියා ගොරට්ටි තුමිය
(ii) මුල් කිතුනු සභාවේ ජීවිත පැවැත්ම
(iii) තේවාචාරි තුමාගේ කාර්ය භාරය
(iv) මව්පියන්ට සංග්‍රහ කරව (4 වන දේව පණත)
(v) පෙරමඟ සරයන්නා වූ ස්නාවක ජුවාම්තුමා
(ලකුණු 05 × 2 = 10 යි.)

❊❊❊

PAST PAPERS WIKI